# පාර්ලිමේන්තු විත්ති

පුවත් හසුන | 34 වැනි කාණ්ඩය | අප්‍රේල් 2023

## නීතිවිද්‍යාලයෙන් පාර්ලිමේන්තුවට....



**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද "පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය පිළිබඳ හැඳින්වීමක්" මැයෙන් ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ සිසුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පාර්ලිමේන්තුවේදී පැවැත්විණි.**




## පුවත්

- පාර්ලිමේන්තුවේ කටයුතු හා ක්‍රියාපටිපාටි පිළිබඳ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ සිසුන් දැනුවත් කෙරේ.
- විගණන සේවා කොමිෂන් සභාවේ නව සාමාජිකයෝ දිවුරුම් දෙති.
- අනුප්‍රාප්තික ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ රහස් ඡන්දයට අදාළ ඡන්ද පත්‍රිකා විනාශ කරනු ලැබූ බව කථානායකවරයා නිවේදනය කරයි.
- ශ්‍රී ලාංකික තරුණයන් සඳහා දකුණු කොරියාවේ රැකියා අවස්ථා වැඩිවශයෙන් ලබා දෙනවා - දකුණු කොරියානු ප්‍රකට සමාගමක ප්‍රධානීහු නියෝජ්‍ය කථානායකවරයා හමුවෙමින් පවසති.

## කාරක සභා පුවත්

- කාර්යක්ෂම සේවාවක් සඳහා පොලිස් දෙපාර්තමේන්තුවේ සමස්ත තොරතුරු තාක්ෂණ වැඩපිළිවෙල පිළිබඳ වාර්තාවක් මාසයක් ඇතුළත ලබා දෙන්න - කෝපා කමිටුව පොලිස් දෙපාර්තමේන්තුවට දැනුම් දෙයි.
- සමෘද්ධි ප්‍රතිලාභ ලබන පවුල්වලින් 33% කට ආසන්න ප්‍රමාණයක් සමෘද්ධි ප්‍රතිලාභය හිමි නොවිය යුතු පවුල් බව කෝපා කමිටුවේදී අනාවරණය වේ.
- කෝප් කමිටුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කෙරේ.
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ප්‍රගතිය කෝප් කමිටුවේදී ඇගයුමට - ජාතික විශ්වවිද්‍යාල නවීකරණය කිරීම සඳහා ජාතික උපාය මාර්ගික සැලැස්මක් ලබා දෙන ලෙසටත් උපදෙස්.
- ශ්‍රම වෙළඳපොළට ගැළපෙන පරිදි උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම පිළිබඳව උසස් අධ්‍යාපනයට අදාළ විශේෂ කාරක සභාවේදී සාකච්ඡා.
- මෙතෙක් කලක් විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද නීති ප්‍රවේශ විභාගය මෙවර නීති විද්‍යාලය මඟින් පවත්වන්නේ ඇයිදැයි අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී අවධානය.
- විදෙස් ආයෝජන දිරි ගැන්වීමට නව ඒකාබද්ධ කම්කරු නීතියක් - කම්කරු හා විදේශ රැකියා අමාත්‍යවරයා අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී පවසයි.
- 40 වසරක් අඩුවක්ව පැවති බත්තරමුල්ල නගරයට බස් පර්යන්තයක් ඉදිකිරීමට භූමියක් - ප්‍රවාහනය පිළිබද ආංශික අධීක්ෂණ කාරක සභාව අදාළ අංශවලට අවශ්‍ය උපදෙස් දෙයි.

- එක්ස්ප්‍රස්පර්ල් වැනි ආපදාවකදී ක්‍රියා කළයුතු පැහැදිළි නිශ්චිත යාන්ත්‍රණයක් කඩිනමින් සකස් කරන්න - පරිසරය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියට දැනුම් දෙයි.

- රජය විසින් වී මිලදී ගැනීම සහ අඩු ආදායම්ලාභී ජනතාවට සහල් ලබාදීමේ වැඩසටහන පිළිබඳ අංශික අධීක්ෂණ කාරක සභාවේදී අවධානය.

- රුමේනියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයක් පිහිටුවීම පිළිබඳව ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ අවධානය

පාර්ලිමේන්තු

ඡායා ගැලරිය



# කවරයේ කතාව



# පාර්ලිමේන්තුවේ කටයුතු හා ක්‍රියාපටිපාටි පිළිබඳ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ සිසුන් දැනුවත් කෙරේ

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද “පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය පිළිබඳ හැඳින්වීමක්” මැයෙන් ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ සිසුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් මාර්තු මස 15 වැනිදා පාර්ලිමේන්තුවේදී පැවැත්විණි.

පාර්ලිමේන්තුවේ කටයුතු සහ ක්‍රියාපටිපාටි පිළිබඳව නීති විද්‍යාලයේ සිසුන් වෙත පුළුල් අවබෝධයක් ලබාදීම සඳහා එම වැඩසටහන සංවිධානය කෙරිණි.

පාර්ලිමේන්තු සහකාර මහ ලේකම් ටිකිරි කේ ජයතිලක, අධ්‍යක්ෂ ව්‍යවස්ථාදායක සේවා සහ අධ්‍යක්ෂ සන්නිවේදන (වැඩබලන) එච්.ඊ. ජනකාන්ත සිල්වා සහ සහකාර අධ්‍යක්ෂ එම්.ජයලත් පෙරේරා යන මහත්වරු විසින් සිසුන් සමග විවෘත සාකච්ඡාවක් පැවැත්වූ අතර එහිදී පාර්ලිමේන්තුව සහ එහි ක්‍රියාවලිය පිළිබඳව ප්‍රශ්න කිරීමට සහ දැනුවත් වීමට සිසුන්ට අවස්ථාව සැලසුණි. මෙම විවෘත සාකච්ඡාව මගින් පාර්ලිමේන්තු කටයුතු, ස්ථාවර නියෝග සහ නීති සම්පාදන ක්‍රියාවලිය වැනි පුළුල් ක්ෂේත්‍ර රැසක් ආවරණය කෙරිණි.

ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ සිසුන් සඳහා පාර්ලිමේන්තුව සංකීර්ණයේ නැරඹුම් චාරිකාවක්ද සංවිධානය කර තිබීම විශේෂත්වයකි.







# විගණන සේවා කොමිෂන් සභාවේ නව සාමාජිකයෝ දිවුරුම් දෙති



විගණන සේවා කොමිෂන් සභාව සඳහා අභිනවයෙන් පත් කරන ලද සාමාජිකයෝ අප්‍රේල් 09 වැනිදා පාර්ලිමේන්තුවේ කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා ඉදිරියේ දිවුරුම් දුන්හ.



කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස විගණකාධිපතිවරයා නිල බලයෙන් පත්වන අතර විගණකාධිපති ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න මහතා එම තනතුරේ දිව්රුම් දුන්නේය.

එයට අමතරව කොමිෂන් සභාවේ අනෙකුත් සාමාජිකයන් ලෙස  විශ්‍රාමික විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ, නන්දසීලී ගොඩකන්ද, ඥාණනන්දරාජා තේවඥානන්, ඒ. එම්. ධර්මජිත් නයනකාන්ත යන මහත්ම මහත්මීහු දිවුරුම් දුන්හ.





# අනුප්‍රාප්තික ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ රහස් ඡන්දයට අදාළ ඡන්ද පත්‍රිකා විනාශ කරනු ලැබූ බව කථානායකවරයා නිවේදනය කරයි



අනුප්‍රාප්තික ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම සඳහා 2022.07.20 දින පවත්වනු ලැබූ රහස් ඡන්දය විමසීමේදී භාවිතයට ගනු ලැබූ ඡන්ද පත්‍රිකා විනාශ කරනු ලැබූ බව කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා මේ මස 04 වැනිදා පාර්ලිමේන්තුවට නිවේදනය කළේය.

1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 18 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සහ 2023.03.24 වැනි දින පවත්වනු ලැබූ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ අනුමතිය සහිතව පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් ඒ ඡන්ද පත්‍රිකා විනාශ කරනු ලැබූ බව ද කථානායකවරයා මෙහිදී පාර්ලිමේන්තුවට දැනුම් දුන්නේය.

# ශ්‍රී ලාංකික තරුණයන් සඳහා දකුණු කොරියාවේ රැකියා අවස්ථා වැඩිවශයෙන් ලබා දෙනවා - දකුණු කොරියානු ප්‍රකට සමාගමක ප්‍රධානීහු නියෝජ්‍ය කථානායකවරයා හමුවෙමින් පවසති

දකුණු කොරියාවේ රැකියා අවස්ථා වැඩිවශයෙන් ශ්‍රී ලාංකික තරුණයන්ට ලබා දීමට අපේක්ෂා කරන බව ප්‍රකට දකුණු කොරියානු සමාගමක් වන 'හුන්ඩායි' (Hyundai) සමාගමේ ඉහළ පෙළේ නියෝජිත පිරිසක් නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ මහතා හමුවෙමින් මේ මස 04 වැනිදා පැවසීය.

දකුණු කොරියානු රැකියා සඳහා ශ්‍රී ලාංකික තරුණයන් තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ, ඊට අදාළ පුහුණුව ඇතුළු කටයුතු සොයා බැලීමට, මෙරටට පැමිණි හුන්ඩායි නැව් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී (CEO) කිම් බොයොන්ග් බෝ (Kim Byong Boo) මහතා ඇතුළු නියෝජිත පිරිසක් නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ මහතා මේ මස (අප්‍රේල් 04) වැනි දින පාර්ලිමේන්තුවේදී හමුවූ අවස්ථාවේදී මේ බව සඳහන් කළහ.

මෙරට තරුණයන් ඉහළ නිපුණත්වයකින් යුතු බවත්, පුහුණුව ලැබූ ශ්‍රී ලාංකේය තරුණයන් වැඩි වශයෙන් එරට රැකියා සඳහා ගෙන්වා ගැනීමට අපේක්ෂා කරන බවත් මෙම නියෝජිත පිරිස පැවසූහ. විශේෂයෙන් මෙම ශ්‍රමිකයන් යහපත් ගුණාංගයන්ගෙන් හෙබි විනයගරුක තරුණයන් වීම වැදගත් බව ද ඔවුහු අවධාරණය කළහ. රජය මැදිහත් වී නිසි වෘත්තීය පුහුණුවක් මෙරට තුළදී ලබා දීමත් ප්‍රමාදයකින් තොරව හැකිතාක් කඩිනමින් පුහුණු ශ්‍රමිකයන් දකුණු කොරියාවට යොමු කිරීමේ අවශ්‍යතාවත් ඔවුහු පෙන්වා දුන්හ. එසේම මෙරට ශ්‍රමිකයන්ගේ පහසුකම් සහ ආරක්ෂාව උපරිම වශයෙන් ලබා දෙන බවට ද සහතික විය.

මේ අනුව නෞකා ඉදිකිරීම් හා අලුත්වැඩියාව, විදුලි කාර්මික වෑල්ඩින් ආදී ක්ෂේත්‍රවල පුහුණු ශ්‍රමිකයන් සඳහා ඉහළ ඉල්ලුමක් පවතින බවත් ඔවුන්ට ඉහළ වැටුප් හිමිවන බව ද නියෝජිත පිරිස මෙහිදී කරුණු දැක්වූහ.

මෙහිදී අදහස් දක්වමින් නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ මහතා ඉල්ලීමක් කර සිටියේ පුහුණු ශ්‍රමිකයන් සඳහා මෙරට අංගසම්පූර්ණ පුහුණු මධ්‍යස්ථානයක් ඉදි කිරීම සඳහා අනුග්‍රහයක් ලබා දෙන ලෙසයි. වෘත්තීය නිපුණත්වයට අමතරව මේ හරහා කොරියානු භාෂාව, සංස්කෘතිය යනාදිය පිළිබඳව අවබෝධයක්ද ලබා දීමට අපේක්ෂා කරන බව ද ඒ මහතා පැවසීය.

ඒ සඳහා කැමැත්ත පළ කළ නියෝජිත පිරිස පෙන්වා දුන්නේ මෙරට දක්ෂ තරුණයන්ට තවදුරටත් දකුණු කොරියාවේ රැකියා අවස්ථා වැඩි වශයෙන් ලබා දීමට









# කාරක සභා පුවත්

# කාර්යක්ෂම සේවාවක් සඳහා පොලිස් දෙපාර්තමේන්තුවේ සමස්ත තොරතුරු තාක්ෂණ වැඩපිළිවෙල පිළිබඳ වාර්තාවක් මාසයක් ඇතුළත ලබා දෙන්න - කෝපා කමිටුව පොලිස් දෙපාර්තමේන්තුවට දැනුම් දෙයි

- **සියලු පොලිස් ස්ථානවලින් කල් ඉකුත් වූ කඳුලු ගෑස් ගෙන්වා අපහරණයට කටයුතු කරන්න.**
- **පොලිස්පති තනතුර ඇතුළු ඉහළ නිලයන් සඳහා කාන්තාවන්ට අවස්ථාව ලබා දෙන වැඩපිළිවෙළ ආරම්භකොට ඇති බව පොලිස්පතිවරයා පවසයි.**




නවීන තොරතුරු තාක්ෂණය භාවිතා කරමින් කාර්යක්ෂම සේවාවක් ලබා දීම සඳහා පොලිස් දෙපාර්තමේන්තුවේ ඉදිරි යෝජිත වැඩපිළිවෙල මාසයක් ඇතුළත ලබා දෙන ලෙස රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති රාජ්‍ය අමාත්‍ය ගරු ලසන්ත අලගියවන්න මහතා අප්‍රේල් මස 26 වැනිදා ශ්‍රී ලංකා පොලිසියට දැනුම් දුන්නේය.

2019, 2020 සහ 2021 වසරවල විගණකාධිපති වාර්තාව සහ වර්තමාන කාර්ය සාධනය පිළිබඳ පරීක්ෂාව සඳහා ශ්‍රී ලංකා පොලිසිය රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට (කෝපා කමිටුවට) අප්‍රේල් මස 26 වැනිදා කැඳවූ අවස්ථාවේදී කමිටු සභාපතිවරයා මේ බව පැවසීය. මහජන ආරක්ෂාව පිළිබද අමාත්‍යාංශයේ ලේකම්වරයා, පොලිස්පතිවරයා ඇතුළු ජ්‍යේෂ්ඨ පොලිස් නිලධාරීන් රැසක් මෙම අවස්ථාවට කැඳවා තිබිණි.

පොලිස් දෙපාර්තමේන්තුව මීට පෙර 2016 වසරේදී කෝපා කමිටුව හමුවට කැදවා තිබූ අවස්ථාවේදී මේ සම්බන්ධ නිර්දේශයක් ලබා දී තිබුන ද තවමත් එය ක්‍රියාත්මක නොවීම පිළිබඳ මෙහිදී ප්‍රශ්න කෙරිණි. පොලිස්පතිවරයා මෙහිදී අදහස් දක්වමින් පවසා සිටියේ ශ්‍රී ලංකා පොලිසිය සඳහා තනි තොරතුරු තාක්ෂණ පද්ධතියක් සැකසීම අපහසු බැවින් කොටස් වශයෙන් තොරතුරු තාක්ෂණ පද්ධති හඳුන්වා දීමට පියවර ගන්නා බවයි. ඒ අනුව පැමිණිල්ලක් ලබා දීමේ සිට අධිකරණ කටයුතුවල තත්ත්වය දක්වා විස්තර ලබා ගත හැකි නව නියමු ව්‍යාපෘතියක් මේ වන විට හැටන් සහ නුවරඑළිය පොලිස් ස්ථාන ආශ්‍රිතව ක්‍රියාත්මක බව පොලිස්පතිවරයා පැවසීය.

මෙහිදී කාරක සභා සභාපතිවරයා අවධාරණය කළේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ඇතුළු අනෙකුත් ආයතන ඒකාබද්ධ කොට අදාළ තොරතුරු ක්ෂණිකව ලබා ගතහැකි තොරතුරු තාක්ෂණ පද්ධතියක් පොලිස් දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත කිරීම අත්‍යවශ්‍ය බවයි. ඒ අනුව දැනට ක්‍රියාත්මක වැඩපිළිවෙල සහ යෝජිත සැලැස්ම පිළිබද වාර්තාවක් මසක් ඇතුළත කමිටුවට ලබා දෙන ලෙස උපදෙස් දුන්නේය.

ශ්‍රී ලංකා පොලිසියේ කාන්තා පොලිස් නිලධාරීන්ගේ හිඟය ඇතුළු ගැටලු පිළිබදව ද මෙහිදී අවධානය යොමුවිය. කාන්තා පොලිස් කොස්තාපල් නිලධාරිනියන් 2419 ක පුරප්පාඩු පවතින බවත් 2023 වසරේ මෙම ප්‍රමාණය සම්පූර්ණ කිරීමට යෝජිතව තිබුනත් වත්මන් ආර්ථික තත්ත්වය මත එය සිදුකිරීමට නොහැකි වූ බවත් මෙහිදී අනාවරණය විය.

මෙහිදී පොලිස්පතිවරයා පවසා සිටියේ පොලිසිය තුළ තිබූ පැරණි තත්ත්වය වෙනස් කොට අනාගතයේ පොලිස්පති තනතුර ඇතුළු ඉහළ නිලයන්ට කාන්තාවන් සඳහා අවස්ථාව ලබා දීමට අවශ්‍ය ප්‍රතිසංස්කරණ සහිත වැඩපිළිවෙල ආරම්භකොට ඇති බවයි. ඒ අනුව අනාගත

කාන්තා පොලිස්පතිවරියක් බිහිවීමට අවස්ථාව සැලසෙනු ඇති බවත් ඒ මහතා පැවසීයි

එසේම පොලිසිය සතු කල් ඉකුත් වූ කඳුලු වායු (tear gas) පිළිබඳව මෙහිදී අවධානය යොමු විය. කල් ඉකුත් වූ කඳුලු වායු අපහරණය කිරීමේ ක්‍රියාදාමය ආරම්භ කොට ඇති බවත් කිසිවිටකත් ඒවා භාවිතා නොකරන බවත් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීහු දැනුම් දුන්හ. මේ අනුව ලංකාවේ සියලු පොලිස් ස්ථානවල පවතින කල් ඉකුත්වූ කඳුලු ගෑස් අපහරණයට කටයුතු කරන ලෙස කමිටුව උපදෙස් දුන්නේය.

එසේම ජාත්‍යන්තර සම්මුතීන්ට අනුව මෙම කඳුලු ගෑස් ඇතුළු මහජන කැරලි කෝලාහල පාලනයේදී ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව ද වාර්තාවක් සකස් කොට කෝපා කමිටුවට ඉදිරිපත් කරන ලෙස කමිටු සභාපතිවරයා දැනුම් දුන්නේය.

පොලිස් නිලධාරීන්ගේ භාෂා කුසලතාව වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාව පිළිබඳව ද මෙහිදි විශේෂ අවධානය යොමු විය. දමිළ සහ ඉංග්‍රීසි භාෂා කුසලතාව පොලිස් නිලධාරීන්ට ලබා දීමේ වැඩසටහන් රැසක් මේ වන විට ආරම්භ කොට ඇති බව ජ්‍යේෂ්ඨ පොලිස් නිලධාරීහු පෙන්වා දුන්හ. එම කටයුතු වඩාත් විධිමත් කිරීමේ අවශ්‍යතාව කමිටුව අවධාරණය කරන ලදී.

පොලිසියේ උසස්වීම්වලට අදාළ ගැටලු, පොලිස් ත්‍යාග අරමුදල කළමනාකරණය, මාර්ග අනතුරු පාලනය, අපරාධ පාලනය ඇතුළු ක්ෂේත්‍ර කිහිපයක ගැටලු සහ ඒවාට විසඳුම් පිළිබඳව ද මෙහිදී සාකච්ඡා විය.









# සමෘද්ධි ප්‍රතිලාභ ලබන පවුල්වලින් 33% කට ආසන්න ප්‍රමාණයක් සමෘද්ධි ප්‍රතිලාභය හිමි නොවිය යුතු පවුල් බව කෝපා කමිටුවේදී අනාවරණය වේ

සමෘද්ධි ප්‍රතිලාභය ලබන පවුල්වලින් 33% කට ආසන්න ප්‍රමාණයක් සමෘද්ධි ප්‍රතිලාභ හිමි නොවිය යුතු පවුල් බවත් ඊට ආසන්න පවුල් ප්‍රමාණයක් සමෘද්ධි ප්‍රතිලාභය හිමි විය යුතු පවුල් වුවද එම පවුල් සඳහා සමෘද්ධි ප්‍රතිලාභය හිමිවී නොමැති බවත් කෝපා කමිටුවේදී අනාවරණය විය.

2015 සිට 2017 දක්වා මුළු දිවයිනම ආවරණය වන පරිදි කරන ලද සමීක්ෂණයකට අනුව මෙම තොරතුරු හඳුනාගෙන ඇති අතර සංඛ්‍යාත්මකව පවුල් 449,979 ක් සමෘද්ධි සහනාධාරය ඉවත් කළ යුතු පවුල් බව මෙහිදී සඳහන් විය.

එසේම මෙම සමෘද්ධිලාභීන් තෝරාගැනීම් සිදු කිරීමේදී අවිධිමත් බවක් නිරීක්ෂණය වන බවද ජාතික විගණන කාර්යාලයේ නිලධාරීහු මෙහිදී පැවසුහ.

මේ පිළිබඳ අනාවරණය වුයේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2019, 2020 හා 2021 වර්ෂවල විගණකාධිපති වාර්තාවල ඇතුළත් කරුණු සහ වර්තමාන කාර්යසාධන සමාලෝචනය කිරීම සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, රාජ්‍ය අමාත්‍ය ගරු ලසන්ත අලගියවන්න මහතාගේ සභාපතිත්වයෙන් මේ මස 25 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස් වූ අවස්ථාවේදීය.

එසේම ප්‍රජාමූල බැංකු වෙත මාසිකව ප්‍රේෂණය කරනු ලබන සමෘද්ධිලාභී ප්‍රතිලාභ මුදල ඇතැම් සමෘද්ධිලාභීන් විසින් මාසිකව ලබා නොගෙන දීර්ඝ කාලීනව තම බැංකු ගිණුම් වල රඳවා තිබුණු බවත් නියැදි පරීක්ෂණයන්ට අනුව ප්‍රජාමූල බැංකු 10ක වසම් 41 ක් තුළ සමෘද්ධිලාභීන් 2433 කගේ ඉතිරිකිරීමේ ගිණුම් වල එසේ රඳවා තිබූ මුදල රු. 59,951,537 ක් බවත් මෙහිදී අනාවරණය විය.

තවද සමෘද්ධිලාභීන් සවිබලගැන්වීම පිළිබඳව ද මෙහිදී සාකච්ඡා වූ අතර සමෘද්ධිලාභීන් සවිබලගැන්වීම පිළිබඳව නිවැරදි වැඩපිළිවෙළක් නොමැති බව නිරීක්ෂණය වන බවද මෙහිදී කෝපා කමිටු සභාපතිවරයා සඳහන් කළේය.

එසේම සමෘද්ධි අධිකාරිය දෙපාර්තමේන්තුවක් බවට පත්කිරීමේදී එහි සිටි සේවක සංඛ්‍යාව අන්තර්ගහනය කිරීම පිළිබඳව කාරක සභාව විමසා සිටි අතර, නිවැරදිව දත්ත ඉදිරිපත් නොවූයෙන් එළඹෙන මැයි මස 26 වැනිදා මෙම දෙපාර්තමේන්තුව කෝපා කමිටුව හමුවට නැවත කැඳවීමට නිර්දේශ කළ අතර එදින මේ පිළිබඳ සියලු නිවැරදි තොරතුරු අවශ්‍ය වන බවද සභාපතිවරයා පැවසීය.

එසේම ලෝක බැංකු අධාර යටතේ 2022 වර්ෂයේ ලැබුණු මූල්‍ය සහනාධාර සම්බන්ධයෙන් ද මෙහිදී සාකච්ඡා වුණු අතර එළඹෙන ජූලි මස සිට සිදුකිරීමට සැලසුම්කොට ඇති යාවත්කාලීන කිරීම් අනුව මෙම දෙපාර්තමේන්තුවේ ඉදිරි සැලසුම් පිළිබඳව ද විමසීම මෙහිදී සිදුවිය. මෙහිදී ඉදිරි සැලසුම් පිළිබඳව සාර්ථක වැඩපිළිවෙලක් ඉදිරිපත් නොවුණු අතර එළඹෙන මැයි මස 26 වැනිදා මෙම කාරක සභාව හමුවට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව පැමිණෙන විට ඒ සඳහා සාර්ථක වැඩපිළිවෙළක් ඉදිරිපත්කරන ලෙසද කෝපා කමිටුව නිර්දේශ කළේය.





# කෝප් කමිටුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කෙරේ...

■ 2015 වසරේ සිට වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට නැහැ

22/10/22 දින පැවති කෝප් කමිටු රැස්වීමේදී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත නිකුත් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳව කමිටුවේ සභාපති මහාචාර්ය රංජිත් බණ්ඩාර මහතා විමසා සිටියේය.

පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව අප්‍රේල් 26 වැනිදා රැස්වූ අතර ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව කමිටුව වෙත කැඳවා තිබිණි.

2015න් පසු වාර්ෂික වාර්තා ඉදිරිපත් කරන ලෙස කමිටුව දිගින් දිගටම අවධාරණය කළද අවසන් වරට ඉදිරිපත් කළ වාර්ෂික වාර්තාවෙන් පසු තවමත් වාර්තාවක් ප්‍රකාශයට පත් නොකිරීම පිළිබඳව සභාපතිවරයා සිය අප්‍රසාදය පළ කළේය.

■ ඉඩම් ලබාදීමේ ක්‍රියාවලිය තවමත් විධිමත් නැහැ








කොමිෂන් සභාව මගින් ඉඩම් ලබාදීමේදී නිසි අනුපිළිවෙලක් සකසන ලෙස කාරක සභාව පසුගිය රැස්වීමේදී නිර්දේශ කළද තවමත් එහි කිසිදු ප්‍රගතියක් නොමැති බව මෙහිදී සාකච්ඡා කෙරිණි. මෙයට අමතරව දේපොළ පැවරීම් ක්‍රියාවලිය පිළිබඳ සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස සභාපතිවරයා ඉල්ලීමක් කරන ලද අතර ඒ පිළිබඳ විධිමත් ක්‍රියාපටිපාටියක් ස්ථාපිත නොකිරීම සම්බන්ධව පරීක්ෂණයක් පවත්වන ලෙස අමාත්‍යාංශයට උපදෙස් ලබා දුන්නේය.

■ විධිමත් ලිපිගොනු පවත්වා නොගැනීම

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව තුළ අස්ථානගත

වී ඇති ලිපිගොනු සම්බන්ධයෙන් කඩිනමින් පරීක්ෂණයක් අමාත්‍යාංශ මට්ටමින් පවත්වන ලෙස සභාපතිවරයා මෙහිදී අමාත්‍යාංශයට උපදෙස් දුන්නේය. තවද, ඉඩම් සම්බන්ධ දැනට අතුරුදහන්ව ඇති ලිපිගොනු පිළිබඳ ඩිජිටල් දත්ත ග්‍රහණය කර ගැනීමට සහ අනෙකුත් දත්ත ලබා ගැනීමට අවශ්‍ය තාක්ෂණික පහසුකම් සපයා මෙය හැකි ඉක්මනින් අවසන් කරන ලෙසද සභාපතිවරයා එහි ප්‍රගතිය පිළිබඳ දින 30 කින් නැවත වාර්තා කරන ලෙස අමාත්‍යාංශ ලේකම්වරයාට දැනුම් දුන්නේය.

■ බද්දට දෙන ලද ඉඩම්

බදු දී ඇති ඉඩම්වලට අදාළව පැනගිනන ගැටලු සම්බන්ධයෙන් සලකා බැලීමේදී සහ නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීමේදී නිශ්චිත අභ්‍යන්තර ක්‍රියා පටිපාටි අනුගමනය කරන ලෙසද සභාපතිවරයා කොමිෂන් සභාවට උපදෙස් දුන්නේය.

මෙම රැස්වීමට රාජ්‍ය අමාත්‍ය ගරු ජානක වක්කුඹුර, ගරු ජගත් පුෂ්පකුමාර, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වන ගරු (නීතිඥ) අනුර ප්‍රියදර්ශන යාපා, ගරු මහින්දානන්ද අලුත්ගමගේ, ගරු නිමල් ලාන්සා, ගරු නලින් බණ්ඩාර ජයමහ, ගරු චමින්ද විජේසිරි, ගරු ජගත් කුමාර සුමිත්‍රආරච්චි, ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය, ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ, ගරු එම්. රාමේෂ්වරන්, ගරු රාජිකා වික්‍රමසිංහ සහ ගරු මධුර විතානගේ යන මහත්ම මහත්මීහු පැමිණ සිටියහ.







# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ප්‍රගතිය කෝප් කමිටුවේදී ඇගයුමට - ජාතික විශ්වවිද්‍යාල නවීකරණය කිරීම සඳහා ජාතික උපාය මාර්ගික සැලැස්මක් ලබා දෙන ලෙසටත් උපදෙස්

1. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ප්‍රගතිය ඇගයීමට ලක් කළ අතර අනෙකුත් ජාතික විශ්ව විද්‍යාල නවීකරණය සඳහා ජාතික උපාය මාර්ගික සැලැස්මක් ද සම්පාදනය කරන ලෙස උපදෙස් දෙයි.

විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවලට අනුව විශ්ව විද්‍යාලය ලබා ඇති ප්‍රගතිය කාරක සභාවේ පැසසුමට ලක්විය. මහා භාණ්ඩාගාරයට බරක් නොවන පරිදි අරමුදල් සැපයීම සඳහා විශ්වවිද්‍යාලය විසින් කාලය සමඟ සංවර්ධනය කරන ලද ස්ථාවර තැන්පතුවක් පවත්වාගෙන යාම මෙහිදී විශේෂ ඇගයුමට ලක්විය. මෙවැනි පියවරයන් දිවයිනේ අනෙකුත් විශ්වවිද්‍යාලවල ද ක්‍රියාත්මක කළ යුතු බව පෙන්වා දුන් කෝප් සභාපතිවරයා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ඉල්ලා සිටියේ උපාධි හා පශ්චාත් උපාධි අධ්‍යාපනයේ ප්‍රමිතිය ඉහළ නැංවීමට තවදුරටත් වඩාත් සාධනීය පියවර ගන්නා ලෙසයි.




2. ප්‍රමාණවත් නොවන සේවක සංඛ්‍යාව

සේවක පුරප්පාඩු පිරවීම සඳහා අදාළ අංශවලට ඉල්ලීම් කළද රටේ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් ඒ සඳහා දුෂ්කරතා ඇති වූ බව අනාවරණය විය. මේ සම්බන්ධයෙන් විසඳුම් ඉල්ලා කෝප් කමිටුවට නිල වශයෙන් ලිඛිතව දන්වන ලෙස කාරක සභාවේ සභාපතිවරයා විශ්වවිද්‍යාලයට නියෝග කළේය.



3. ඉඩම් ගැටලුව විසඳීමට කෝප් කමිටුවෙන් පියවර

අනවසර පදිංචිකරුවන් අල්ලාගත්, විශ්ව විද්‍යාලයට අයත් ඉඩමක් මුදල් වියදම් කර තිබියදීත් සම්පූර්ණයෙන් පවරා නොගැනීම සම්බන්ධයෙන් මෙහිදී අවධානය යොමු විය. කොවිඩ් ව්‍යාප්තියත් සමඟ හමුදාව එම පරිශ්‍රය ප්‍රයෝජනයට ගෙන තිබූ බවත් මෙහිදී අනාවරණය විය. මේ සම්බන්ධයෙන් කඩිනම් විසඳුමක් සඳහා කෝප් කමිටුව විසින් ආරක්ෂක ලේකම්වරයාට ලිඛිතව දැනුම් දෙන බවට සභාපතිවරයා විශ්වවිද්‍යාල බලධාරීන්ට සහතික විය.

4. විදේශීය සිසුන් සම්බන්ධයෙන් කෝප් කමිටුවේ අවධානය

වසර 2012-2016 සිට ලෝක ශ්‍රේණිගත කිරීම්වල පහත

වැටීමෙන් පසුව, විශ්ව විද්‍යාලය එතැන් සිට ක්‍රමිකව ශ්‍රේණිගත කිරීම්වල ඉහළ ගොස් ඇති බව අනාවරණය විය. බලධාරීන් මෙහිදී ප්‍රකාශ කළේ මෙම ශ්‍රේණිගත කිරීම ඉහළ නැංවීමට හේතු වූ ජාත්‍යන්තර කීර්තිමත් පර්යේෂණ පත්‍රිකා හැරුණු විට, අන්තර් ශිෂ්‍ය ගැටුම් සහ අතිශය ඉහළ සුදුසුකම් කඩඉම් ලකුණු ලබා ගැනීමේ දුෂ්කරතා ආදිය විදේශීය සිසුන් ආකර්ෂණය කර ගැනීමට බාධාවක් ලෙස ක්‍රියා කළ බවයි. ඔවුන්ගේ අධ්‍යයන කටයුතුවලට අමතරව ශිෂ්‍ය ණය පහසුකම් සැපයීම වැනි විසඳුම් ගවේෂණය කරන ලෙස කෝප් සභාපතිවරයා විශ්වවිද්‍යාල බලධාරීන්ට උපදෙස් දුන්නේය. එසේම මෙම ගැටලු විසඳීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කර සමාලෝචනය සඳහා ඉදිරිපත් කරන ලෙස විශ්වවිද්‍යාලයට නියෝග කළේය.

**විමර්ශණයෙන් පසු කෝප් කමිටුව පහත නිර්දේශ ද ලබා දෙන ලදී**.

- ඉදිකිරීම් සමාගමකට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීම සහ සති 02ක් ඇතුළත ඒ පිළිබඳව තත්ත්වය වාර්තා කිරීම.
- ශ්‍රවණාගාරයක තත්ත්වය සම්බන්ධයෙන් මාස 03ක් ඇතුළත වාර්තා කිරීමක් සිදු කිරීම.
- මුදල් අමාත්‍යාංශය සමඟ එක්ව කටයුතු කොට භාවිතයට නොගත් ශිෂ්‍යත්ව අරමුදල් සම්බන්ධයෙන් මාස 03 ක් ඇතුළත දැනුම් දීම.
- අදාළ ගිවිසුම් කඩකිරීම් සම්බන්ධයෙන් අයකර ගැනීම් නිරාකරණය කර ගැනීම සඳහා සති 02ක් ඇතුළත වාර්තා කිරීම.
- ආපනශාලාවක් ඉදිකිරීම සඳහා ගිවිසුම්ගත සමාග මක් සමඟ අන්‍යෝන්‍ය වශයෙන් අවසන් කිරීමේ ගිවිසුමක් කඩිනමින් අත්සන් කිරීම.

විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ ප්‍රගමනය සඳහා ශ්‍රී ලංකාවේ අනෙකුත් විශ්වවිද්‍යාල සඳහා අනුගමනය කළ යුතු ජාතික ප්‍රතිපත්ති රාමුවක් සම්පාදනය කිරීමට මැදිහත්වන ලෙසට ද කෝප් සභාපතිවරයා විශ්ව විද්‍යාල පාලනාධිකාරියට දැනුම් දුන්නේය.








# ශ්‍රම වෙළඳපොළට ගැළපෙන පරිදි උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම පිළිබඳව උසස් අධ්‍යාපනයට අදාළ විශේෂ කාරක සභාවේදී සාකච්ඡා

ශ්‍රම වෙළඳපොලට ගැළපෙන පරිදි උසස් අධ්‍යාපනයට ඇති අවස්ථා පුළුල් කිරීම සිදුකළ යුතු බව අමාත්‍ය ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතාගේ සභාපතීත්වයෙන් පසුගියදා රැස්වූ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන අවස්ථා සහ එම ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේදී අවධාරණය කෙරිණි.

එහිදී මෙරට උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම සම්බන්ධයෙන් මන්ත්‍රීවරු රැසක් අදහස් දැක්වූහ. උසස් පෙළ විභාගයෙන් පසු අධ්‍යාපනය හැර යන සිසුන්ට උසස් අධ්‍යාපන අවස්ථා වැඩි කිරීම සඳහා නිසි ක්‍රමවේදයන් සකස් කළ යුතු බව කමිටුවේ සභාපති ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා මෙහිදී පැවසීය.

උසස් අධ්‍යාපනය සඳහා මෙරට සිසුන් විදේශගත වීමෙන් මෙරටට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් අහිමි වන බවත්, එය වළක්වා ගැනීමට ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සමඟ එක්ව ශ්‍රී ලංකාව තුළ උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කළ යුතු බවත් මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් මෙහිදී පෙන්වා දුන්හ. එසේම මෙමගින් විදේශීය සිසුන් ආකර්ෂණය කර ගැනීමට හැකි බවත්, ඒ අනුව ශ්‍රී ලංකාව උසස් අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමට අවස්ථාව පවතින බවත් ඔවුහු වැඩිදුරටත් පෙන්වා දුන්හ.

මෙරට හෙද වෘත්තිකයන් සඳහා විදෙස් රටවල විශාල ඉල්ලුමක් පවතින බවත් මෙම අවස්ථාවෙන් ප්‍රයෝජන ගෙන මෙරට හෙද හෙදියන් වැඩි වශයෙන් විදෙස් රටවලට යැවීමට ඇති හැකියාව පිළිබදවත් මෙහිදී සාකච්ඡා කෙරිණි. හෙද හෙදියන්ට ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව නිසි අධ්‍යාපනය සහ පුහුණුව ලබාදීමේ මූලික ව්‍යුහය ස්ථාපිත කළ යුතු බව ද මන්ත්‍රීවරු මෙහිදී අවධාරණය කළහ. මේ සඳහා හෙද වෘත්තිකයන්ට පුහුණුවේදීම ඉංග්‍රීසි භාෂා දැනුම ලබාදීමේ අවශ්‍යතාවයද ඔවුහු පෙන්වා දුන්හ.











# මෙතෙක් කලක් විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද නීති ප්‍රවේශ විභාගය මෙවර නීති විද්‍යාලය මගින් පවත්වන්නේ ඇයිදැයි අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී අවධානය

මෙතෙක් කාලයක් විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද නීති ප්‍රවේශ විභාගය මෙවර නීති විද්‍යාලය මගින් පවත්වන්නේ ඇයිදැයි යන්න පිළිබඳව අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ අමාත්‍ය උපදේශක කාරක සභාවේදී මේ මස අවධානය යොමු විය.

අමාත්‍ය ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතාගේ සභාපතීත්වයෙන් පැවති මෙම රැස්වීමේදී ඒ මහතා ප්‍රකාශ කළේ මේ සම්බන්ධයෙන් කරුණු විමසා නීති අධ්‍යයන සභාව වෙත ලිඛිතව කරුණු ඉදිරිපත් කරන බවයි.

2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, අංක 2317/28 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කළ නියෝගය සහ අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට අදාළ වාර්ෂික වාර්තා හයක් කාරක සභාවේදී සලකා බලා අනුමත කරන ලදී.

තවද, ඉංග්‍රීසි භාෂාවෙන් නීති විද්‍යාල විභාග පැවැත්වීමට අදාළව නීති අධ්‍යාපන කවුන්සිලය විසින් පනවන ලද, 2020 දෙසැම්බර් 30 වැනි දින අංක 2208/13 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර තිබූ යෝජනාව පාර්ලිමේන්තුවේදී පසුගියදා පරාජයට පත්වීම පිළිබඳවද මෙහිදී අවධානය යොමු විය.

ඒ අනුව, ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ ඉංග්‍රීසි මාධ්‍යයෙන්





විභාග පැවැත්වීමේ යෝජනා ඇතුළත් එකී ගැසට් පත්‍රය පාර්ලිමේන්තුවේදී පරාජයට පත් වීමේදී, එම ගැසට් පත්‍රයේ ඇතුළත් අනෙකුත් යෝජනා ද ඒ සමඟම පරාජය වීම පිළිබඳව මෙහිදී අවධානය යොමු විය.

නීති විද්‍යාලයේ මෙම තීරණවල ප්‍රතිඵලයක් ලෙස අප්‍රේල් මස අවසානයේ විභාගයට පෙනී සිටීමට නියමිත සිසුන්ට බලවත් අසාධාරණයක් සිදුවන බව ද කමිටුව වැඩිදුරටත් පෙන්වා දුන්නේය.

එමෙන්ම ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් විභාග පැවැත්වීමේ නීතිය හේතුවෙන් අයදුම් නොකළ සිසුන්ට විභාග සඳහා අයදුම් කිරීමට අවස්ථාව ලබාදීමේ හැකියාව සොයා බලන ලෙස කාරක සභික මන්ත්‍රීවරයන් ඉල්ලා සිටියහ. ඒ සඳහා ඔවුන්ට සැලකිය යුතු කාලයක් ලබාදිය යුතු බව ද මන්ත්‍රීවරයවන් පෙන්වා දුන්හ.

අමාත්‍ය ගරු. (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා සඳහන් කළේ සංස්ථාගත නීති අධ්‍යපන සභා පනත ප්‍රකාරව අමාත්‍යවරයාට ප්‍රතිපත්තිමය මඟ පෙන්වීම ලබා දීමට බලය තිබුණද අධ්‍යයන කටයුතු සම්බන්ධයෙන් තීරණ ගනු ලබන්නේ ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන නීති අධ්‍යයන සභාව බවයි. කෙසේ වෙතත්, ඉදිරිපත් වූ ඉල්ලීම් සලකා බලා අමාත්‍යවරයා ප්‍රකාශ කළේ ඉහත සඳහන් නීතිරීති හේතුවෙන් අයදුම් කිරීමෙන් වැළකී සිටින සිසුන්ට ඉදිරි විභාග සඳහා අයදුම් කිරීමට ඉඩ සලසන ලෙස නීති අධ්‍යාපන සභාවෙන් ඉල්ලා සිටින බවයි.

# විදෙස් ආයෝජන දිරි ගැන්වීමට නව ඒකාබද්ධ කම්කරු නීතියක් - කම්කරු හා විදේශ රැකියා අමාත්‍යවරයා අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී පවසයි



දැනට පවතින කම්කරු නීතියේ සංකීර්ණ තත්ත්ව මගහැරෙන ලෙස නව ඒකාබද්ධ කම්කරු නීතිය සකස් කිරීම සඳහා කඩිනමින් පියවර ගන්නා බව කම්කරු හා විදේශ රැකියා කටයුතු අමාත්‍ය ගරු මනුෂ නානායක්කාර මහතා අප්‍රේල් මස 25 වැනිදා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළේය.

ඒ අනුව මෙම ඒකාබද්ධ නීතිය සැකසීම සඳහා මහජනතාව ඇතුළු අදාළ සියලු පාර්ශවයන්හි අදහස් හා යෝජනා ලබා ගැනීම මැයි 2 වැනිදා සිට ආරම්භ කරන බව ද අමාත්‍යවරයා පැවසීය.

අමාත්‍යවරයා මේ බව සඳහන් කළේ අප්‍රේල් මස 25 වැනිදා පාර්ලිමේන්තුවේදී පැවති කම්කරු හා විදේශ රැකියා කටයුතු අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී ය.

දැනට සංකීර්ණ ලෙස විසිරී පවතින මෙරට කාර්මික නීතිය ඒකාබද්ධ කම්කරු නීතියක් බවට පත්කිරීමට අපේක්ෂා කරන බවත්, දේශීය හා විදේශීය ආයෝජකයන් දිරිමත් කිරීම සඳහා එය කාලීන වශයෙන් අත්‍යවශ්‍ය පියවරක් බවත් අමාත්‍යවරයා මෙහිදී පෙන්වා දුන්නේය. මේ අනුව නව ඒකාබද්ධ නීතිය මඟින් සේවා යෝජකයින් සහ සේවකයන් අතර ඇති වන ආරවුල් පහසුවෙන් විසඳීමට හැකියාව ලැබෙනු ඇත. විශේෂයෙන් මෙරටට පැමිණෙන ආයෝජකයින්ට ව්‍යාපාර කටයුතු පහසුවෙන් ආරම්භ කිරීමට සහ පවත්වාගෙන යාමට පහසුකම් සැලසීම සඳහා මෙම නව නීති හේතුවන බවත් අමාත්‍යවරයා පෙන්වා දුන්නේය.



සේවක අර්ථසාධක අරමුදලේ ලියාපදිංචි වී නොමැති ව්‍යාපාර පිළිබඳව ද මෙහිදී අවධානය යොමු විය. මේ වන විට සේවක අර්ථසාධක අරමුදලේ ලියාපදිංචි වී ඇත්තේ ව්‍යාපාරික සමාගම් 80,000ක් පමණක් බව අමාත්‍යවරයා පෙන්වා දුන්නේය. මන්ත්‍රීවරුන් අවධාරණය කළේ ලියාපදිංචි නොකළ සමාගම්වලට එරෙහිව කඩිනමින් පියවර ගත යුතු බවයි. ඒ අනුව දිවයිනේ විවිධ ප්‍රදේශවල ලියාපදිංචි වී ඇති ව්‍යාපාර පිළිබඳ තොරතුරු කම්කරු අමාත්‍යාංශය වෙත එවන ලෙස සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්ට, පළාත් පාලන

ආයතන කොමසාරිස්වරුන්ට ලිඛිතව දැනුම් දීමට මෙහිදී තීරණය විය. එසේම එවැනි සමාගම් සඳහා ගතහැකි ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ සැලැස්මක් මාසයක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස ද අමාත්‍යවරයා කම්කරු දෙපාර්තමේන්තුවට සහ සේවක අර්ථසාධක අරමුදලට උපදෙස් දුන්නේය.

විදේශ රැකියා පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන ලෙස අමාත්‍යවරයා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට උපදෙස් ලබාදුන්නේයි එසේම විදේශ ශ්‍රමිකයින් යැවීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විශේෂ කෝටාවක් ලබාදී නොමැති බවද ඒ මහතා සඳහන් කළේය.

තවද නුපුහුණු ශ්‍රමිකයන් 26,000ක් සහ පුහුණු ශ්‍රමිකයන් 60,000කට අධික පිරිසක් ඇතුළුව 90,000කට ආසන්න පිරිසක් මෑත කාලයේ විදේශ රැකියා සඳහා යොමු කර ඇති බව විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධානියා මෙහිදී අදහස් දක්වමින් පැවසීය.

මේ අතර රුමේනියාවේ ශ්‍රී ලාංකිකයන්ගේ ගැටලු විසඳීම සඳහා රුමේනියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයක් පිහිටුවීමට ගත් පියවර සම්බන්ධයෙන් ශ්‍රී ලංකා - රුමේනියා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය වෙනුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු යදාමිණි ගුණවර්ධන මහතා මෙහිදී සිය කෘතඥතාව පළ කළ සිටියේය.











# 40 වසරක් අඩුවක්ව පැවති බත්තරමුල්ල නගරයට බස් පර්යන්තයක් ඉදිකිරීමට භූමියක් - ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව අදාළ අංශවලට අවශ්‍ය උපදෙස් දෙයි

- ගමන්වාරය එනතුරු බස් ගාල් කිරීමේ පහසුකම් නොමැතිවීමේ ගැටලුව විසඳීමට කොළඹ කොටුව ප්‍රදේශයෙන් භූමියක් ලබා දීමටත් තීරණය කෙරේ
- සංචාරක ව්‍යාපාරය වෙනුවෙන් දුම්රිය ස්ථාන ආශ්‍රිත නව පාපැදි ව්‍යාපෘතියක්




බත්තරමුල්ල නගරයට බස් පර්යන්තයක් ඉදිකිරීම සඳහා බත්තරමුල්ල කඩුවෙල මාර්ගයට ආසන්නයෙන් හඳුනාගෙන ඇති ඉඩම කඩිනමින් නිදහස් කරදෙන ලෙස බලශක්තිය සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා මාර්තු 25 වැනිදා අදාළ අංශවලට උපදෙස් දුන්නේය.

නාගරික සංවර්ධන අධිකාරිය සතු මෙම ඉඩම මේවන විට තාවකාලිකව ආරක්ෂක අංශ භාවිත කරන බැවින් ආරක්ෂක ලේකම්වරයාට මේ පිළිබදව දන්වා ඉඩම නිදහස් කරගැනීමට කඩිනමින් කටයුතු කරන ලෙසත්, මාසයක් ඇතුළත මේ පිළිබඳව කාරක සභාවට දන්වන ලෙසත් කමිටු සභාපතිවරයා උපදෙස් දුන්නේය.

බත්තරමුල්ල ප්‍රදේශය පරිපාලන නගරය බවට පත්වී වසර 40 ක කාලයක් ගතව ඇතත් තවමත් බස් පර්යන්තයක් නොමැතිවීම බරපතල ගැටලුවක් බව මෙහිදී සාකච්ඡා විය. ඒ අනුව මේ සඳහා කඩිනමින් ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාව කමිටුවේදී අවධාරණය කෙරිණි.




ජාතික ප්‍රවාහන කොමිසම මගින් ඉදිරිපත් කළ ගැටලුවලට විසදුම් ලබා දීම සඳහා බලශක්තිය සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව මාර්තු 25 වැනිදා පාර්ලිමේන්තුවේදි රැස්වූ අතර ප්‍රවාහන අමාත්‍යාංශය, දුම්රිය දෙපාර්තමේන්තුව, නාගරික සංවර්ධන අධිකාරිය, ජාතික ප්‍රවාහන කොමිසම, කොළඹ මහ නගර සභාව, බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය ඇතුළු ආයතන කැඳවා තිබිණි.

කොළඹ ප්‍රධාන බස්නැවතුමේ බස් රථ, ඊළඟ ගමන් වාරය

එනතුරු නවතා තැබීමට කොළඹ කොටුව පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවට සහ නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩම්වලින් කොටසක් තාවකාලිකව නිදහස් කිරීමටද මෙහිදී එකඟත්වය පළ විය. දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩම අක්කරයක පමණ වපසරියකින් යුතු බවත් මෙහිදී අනාවරණය විය. එසේම පැරණි මැනින් වෙළඳපොළ පිහිටි නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩම අක්කර පහකින් යුතු බවත් ඉන් අක්කර දෙකක් තාවකාලිකව නිදහස් කිරීමටත් මෙහිදී අදාළ පාර්ශව එකඟ විය. මේ අනුව කඩිනමින් මේ සම්බන්ධව කටයුතු කොට සතියක් තුළ මෙහි ප්‍රගතිය කමිටුවට වාර්තා කරන ලෙස ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නාලක බණ්ඩාර කෝට්ටගොඩ මහතා අදාළ අංශවලට දැනුම් දුන්නේය.



ඉලෙක්ට්‍රොනික ටිකට්පත් සේවය ඇති කිරීම, GPS තාක්ෂණය බස්රථ සඳහා හඳුන්වා දීම, පෞද්ගලික මගී ප්‍රවාහන සේවාවල ගුණාත්මක බව වැඩි කිරීම ඇතුළු කරුණු කාරනා පිළිබඳව ද මෙහිදී සාකච්ඡා විය. කාසි සහ නෝට්ටු භාවිතය නිසා දිනකට බස්රථවල රු.බිලියනයකට ආසන්න මුදලක් දෛනිකව සංසරණය වන බවත්, මහබැංකුවේද සහය ඇතිව නූතන ඉලෙක්ට්‍රොනික ටිකට්පත් සේවාව කඩිනමින් ආරම්භ කළ යුතු බවත් මෙහිදී සාකච්ඡා විය. ඒ අනුව ඉදිරියේදී ඒ සම්බන්ධව අවධානය යොමු කිරීමටත් මෙහිදී තීරණය විය



සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම සඳහා දුම්රිය ස්ථාන ආශ්‍රිතව පාපැදි කුලී පදනම මත ලබා දීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම පිළිබඳව ද මෙහිදී සාකච්ඡා විය. ඒ අනුව අනුරාධපුර දුම්රිය ස්ථානයෙන් මෙය නියමු ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කිරීමට පියවර ගන්නා ලෙස ප්‍රවාහන ලේකම්වරයාට කමිටු සභාපතිවරයා උපදෙස් දුන්නේය.



# එක්ස්ප්‍රස්පර්ල් වැනි ආපදාවකදී ක්‍රියා කළයුතු පැහැදිළි නිශ්චිත යාන්ත්‍රණයක් කඩිනමින් සකස් කරන්න - පරිසරය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියට දැනුම් දෙයි

- අවශ්‍ය නෛතික ප්‍රතිපාදන ලැබෙන පරිදි පනත සංශෝධනය කිරීමේ ප්‍රගතිය මසකින් කමිටුවට වාර්තා කරන ලෙසටත් උපදෙස්
- නීතිපති සහ නීති ප්‍රවීණයන් අතර පැවති සාකච්ඡාවේදී සිංගප්පූරුවේදී නඩු පැවරීමට එකගත්වයක් පළ නොවූ බවටත් ප්‍රකාශයක්




එක්ස්ප්‍රස් පර්ල් නෞකා අනතුර වැනි ආපදාවකදී ක්‍රියා කළයුතු ආකාරය දැක්වෙන පැහැදිළි නිශ්චිත යාන්ත්‍රණයක් කඩිනමින් සකස් කරන ලෙස පරිසරය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අජිත් මාන්නප්පෙරුම මහතා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියට අප්‍රේල් මස 25 වැනිදා දැනුම් දුන්නේය.

මෙවැනි ආපදාවකදී ඊට මුහුණ දීමේ වගකීම සහිත ප්‍රධාන ආයතනය සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය බැවින්, කඩිනමින් ප්‍රතිචාර දැක්වීම හා වන්දි ලබා ගැනීම සඳහා අවශ්‍ය නෛතික ශක්තිය ලැබෙන පරිදි සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත සංශෝධනය කිරීම කඩිනමින් සිදුකරන ලෙසත්, එහි ප්‍රගතිය මාසයකින් නැවත කමිටුවට වාර්තා කරන ලෙසත් සභාපතිවරයා උපදෙස් දුන්නේය.

එසේම මෙවැනි ආපදා අවස්ථාවකදී වන්දි මුදල් ලබා ගන්නා තුරු අවශ්‍ය මුදල් ප්‍රතිපාදන සපයා ගැනීම සඳහා වෙනම අරමුදලක් පිහිටුවීමේ අවශ්‍යතාව ද මෙහිදී සාකච්ඡා විය. මෙරටට පැමිණෙන නෞකාවලින් ලබා ගන්නා සුළු බදු මුදලකින් මෙම අරමුදල තර කළ හැකි බවද මෙහිදී කමිටුව පෙන්වා දුන්නේය.

එක්ස්ප්‍රස් පර්ල් නෞකා අනතුරට අදාළ පරිසර හා අනෙකුත් හානිය සහ අදාළ වන්දි මුදල් ලබා ගැනීමේ කටයුතු පිළිබඳ විමර්ශනය සඳහා පැවති මෙම පරිසර කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, සාගර නීතිය පිළිබඳ ප්‍රවීණයන්, විද්වතුන්, පරිසර සංවිධාන නියෝජිතයන් ඇතුළු පිරිසක් කැඳවා තිබිණි.

මෙම කාරක සභාව අවසන් වරට රැස්වූ අවස්ථාවේදී ගත් තීරණයක් මත නීතිපතිවරයා සහ නීති ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් අතර පසුගියදා පැවති රැස්වීමේදී මෙම අනතුරට අදාළ නඩුව සිංගප්පූරුවේ පැවරීම පිළිබඳ කිසිදු එකගතාවකට නොපැමිණි බව මෙහිදී අදහස් දක්වමින් සාගර නීතිය පිළිබඳ විශේෂඥයකු වන ආචාර්ය ඩෑන් මාලික ගුණසේකර මහතා පැවසීය. එහිදී බහුතරයක් නීති විශාරදයින් පවසා සිටියේ මෙරට නඩුව ගොනු කිරීම වාසි සහගත බවත්ය. එසේම මීට පෙර සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් පත්කළ නීති ප්‍රවීණයන්ගෙන් සැදුම් ලත් කමිටු වාර්තාවේද සඳහන් වූයේ මෙරට නඩු පැවරීම යෝග්‍ය බවත් ඒ මහතා පෙන්වා දුන්නේය.

ඒ අනුව මෙම කරුණු කාරණා සහ තත්ත්වයන් පිළිබඳව ජනාධිපතිවරයා හමුවී එතුමාව දැනුවත් කිරීම වඩා යෝග්‍ය බව ද මෙහිදී සාකච්ඡා විය.

එසේම මෙවැනි ආපදා අවස්ථාවලදී මෙරටට ලබා ගත

හැකි උපරිම වන්දී ප්‍රමාණය ලබා ගැනීම සඳහා ක්‍රියාකර ඇති ආකාරයේ ගැටලු පවතින බවද මෙහිදී පැමිණ සිටි විද්වතුන් පෙන්වා දුන්හ.  මීට පෙර සිදුවූ නිව් ඩයමන්ඩ් නෞකා අනතුරට අදාළව නඩු පැවරීම ප්‍රමාද වූ බවත් නඩු පැවරීමට අදාළ කාල සීමාව අවසන් වීමට දින දෙකකට පෙර නඩු පැවරීම සිදුවූ බවත් මහාචාර්ය රුචිරා කුමාරතුංග මහත්මිය පැවසුවාය. එහිදී නීතිපති දෙපාර්තමේන්තුවේ අදාළ නිලධාරීන් දෙදෙනෙක් විදෙස්ගතව සිටි බැවින් අදාළ ලිපිගොනු  ලබා ගැනීම පවා අපහසු වූ බවත් නැවත සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය මගින් ලිපිගොනු ලබා ගෙන නඩු පැවරීමට සිදුවූ බවත් ඇය පැවසුවාය.

මෙරට සමුද්‍රීය ආරක්ෂණ කටයුතු සහ වන්දී ලබා ගැනීමේ කටයුතු වඩාත් විධිමත් ලෙස සිදු කළ යුතු බැවින් සියලු අදාළ  පාර්ශ්ව සමග සාකච්ඡා කොට නිශ්චිත වැඩපිළිවෙලක් සකස් කිරීමත්, අවශ්‍ය බලතල ලැබෙන පරිදි කඩිනමින් පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවත් කමිටුව අවධාරණය කරන ලදී.











# රජය විසින් වී මිලදී ගැනීම සහ අඩු ආදායම්ලාභී ජනතාවට සහල් ලබාදීමේ වැඩසටහන පිළිබඳ අංශික අධීක්ෂණ කාරක සභාවේදී අවධානය

රජය විසින් 2022/23 මහ කන්නයෙහි වී අස්වැන්නෙන් වී මිලදී ගැනීම සහ අඩු ආදායම්ලාභී ජනතාවට සහල් ලබාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ඇතිවී තිබෙන ගැටලු පිළිබඳව ආහාර සුරක්ෂිතතාව හා කෘෂිකර්මය පිළිබඳ අංශික අධීක්ෂණ කාරක සභාවේදී අවධානය යොමු විය.

එම කාරක සභාව, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩී. වීරසිංහ මහතාගේ සභාපතිත්වයෙන් පසුගියදා පාර්ලිමේන්තුවේදී රැස් වූ අවස්ථාවේදී මේ සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙරිණි, මුදල් අමාත්‍යාංශයේ නිලධාරීහු, කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිලධාරීහු, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ නිලධාරීහු සහ දිස්ත්‍රික් ලේකම්වරු සෘජුව සහ මාර්ගගත තාක්ෂණය හරහා මෙම කාරක සභා රැස්වීමට සහභාගී වූහ.

මේ අනුව, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ නිලධාරීන් සමග පැවති සාකච්ඡාවේදී වී මිලදී ගැනීමේ සහ බෙදාහැරීමේදී ඇතිවී තිබෙන ප්‍රධාන ගැටලු තුනක් හඳුනාගන්නා ලදී.

වී නිෂ්පාදනය නොකරන දිස්ත්‍රික්කවලට සහල් බෙදාහැරීමේදී සිදුවන ප්‍රමාදය පිළිබඳ කාරක සභාවේ දී සාකච්ඡාවට ලක්විය. ඒ අනුව, වී නිෂ්පාදනය නොකරන දිස්ත්‍රික්කවල සිටින අඩු ආදායම්ලාභී ජනතාවට පළමු හාල් කිලෝ 10 කඩිනමින් බෙදා හැරීමට සැලැස්මක් සකස් කරන ලෙස කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩී. වීරසිංහ මහතා අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දුන්නේය.

එමෙන්ම වී මිලදී ගැනීමේ දී සිදුවන අක්‍රමිකතා හේතුවෙන් රජය නියම කරන ලද මිලට වී මිලදී නොගන්නා බවත් එමගින් ගොවීන්ට නිසිලෙස ප්‍රතිලාභ නොලැබෙන බවත් මන්ත්‍රීවරු පෙන්වා දුන්හ. මෙම අක්‍රමිකතා වැළැක්වීමට පියවර ගන්නා ලෙස මන්ත්‍රීවරු අවධාරණය කළහ. ඒ අනුව වී මිලදී ගැනීමේදී සිදුවන අක්‍රමිකතා හඳුනාගෙන ඒවා විසඳීමට කඩිනම් පියවර ගන්නා ලෙස නිලධාරීන්ට උපදෙස් දුන් කාරක සභාවේ සභාපතිවරයා මේ තුළින් ගොවීන් ගොවිතැනින් ඉවත්ව යෑම වළක්වා ගත හැකි බවද සඳහන් කළේය.

මේ අතර, ප්‍රතිලාභීන්ගේ දත්ත නඩත්තු නොකිරීම







හේතුවෙන් සහල් බෙදාහැරීමේ දී මහජනතාවට අපහසුතාවන්ට මුහුණ දීමට සිදුවන බව කාරක සභාවේ දී අවධානයට ලක් විය. මේ හේතුවෙන් අගහිඟකම් ඇති සුදුස්සන්ට ප්‍රතිලාභ නොලැබෙන බවත්, නුසුදුස්සන්ටත් සහල් ලැබෙන බව මන්ත්‍රීවරු පැවසූහ. තවද, මහජනතාවට දිගු පෝලිම්වල රැඳී සිටීමට සිදුවන බවද ඔවුහු පෙන්වා දුන්හ. ඒ අනුව, දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂවරු, දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සම්බන්ධීකරණයෙන් දත්ත ගබඩාවක් නිර්මාණය කළ හැකි බව ද කාරක සභාව පෙන්වා දුන්නේය.

මෙයට අමතරව, 2023 යල කන්නය සඳහා පොහොර බෙදාහැරීම, පොහොර මිල නියාමනය කිරීම, කාබනික පොහොර නිෂ්පාදකයින් ආරක්ෂා කිරීම, දේශීය බීජ නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සහ ආනයන කරනු ලබන බීජ සඳහා මිල නියාමනය කිරීම ඇතුළු කාරණා පිළිබඳවද කාරක සභාවේ දීර්ඝ වශයෙන් සාකච්ඡාවට ලක් විය.

# රුමේනියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයක් පිහිටුවීම පිළිබඳව ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ අවධානය

රුමේනියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයක් පිහිටුවීමේ හැකියාව පිළිබඳව ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී සාකච්ඡා කෙරිණි. එම කාරක සභාව එහි සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නාමල් රාජපක්ෂ මහතා ප්‍රධානත්වයෙන් මාර්තු 22 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස්විය.



ඒ අනුව, රුමේනියාව තුළ රාජතාන්ත්‍රික සබඳතා පිහිටුවීමට අදාළ අභියෝග සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශයේ නියෝජිතයින්ගෙන් කමිටුව විමසා සිටියේය. මේ වන විට රුමේනියාවේ සැලකිය යුතු ශ්‍රී ලාංකික ජනගහණයක් ජීවත් වන බවත් ඔවුන්ගේ දුක්ගැනවිලි සොයා බැලීමට ශ්‍රී ලංකා තානාපති කාර්යාලයක් එහි නොමැති වීම නිසා එම ජනතාව බොහෝ අපහසුතාවයන්ට පත්වන බවත් කමිටුව මෙහිදී පෙන්වා දුන්නේය.



එහිදී නිලධාරීන් ප්‍රකාශ කළේ රුමේනියාවේ තානාපති කාර්යාලයක් පිහිටුවීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බව සහ සේවක සංඛ්‍යාව දැනටමත් අනුමත කර ඇති අතර තානාපති කාර්යාලයක් පිහිටුවීමට කටයුතු කරමින් සිටින බවයි. ඒ සම්බන්ධයෙන් තවදුරටත් ප්‍රමාදයකින් තොරව පියවර ගන්නා ලෙස කමිටුව පැමිණ සිටි නිලධාරීන්ට උපදෙස් දුන්නේය.

එයට අමතරව, ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳව කමිටුව තවදුරටත් සාකච්ඡා කළේය. විදේශ කටයුතු අමාත්‍යාංශයේ විදේශ ප්‍රතිපත්ති විධාන වලට අදාළ ප්‍රධාන කරුණු 20 පිළිබඳව අමාත්‍යාංශ ලේකම්වරයා මෙහිදී විස්තර කළේය. ඔහු පෙන්වා දුන්නේ ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය පදනම් වී ඇත්තේ මධ්‍යස්ථ සහ නොබැඳි ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් සියලු ස්වෛරී රටවල් සමඟ මිත්‍රශීලී සබඳතා පවත්වා ගැනීම මත බවයි. එමෙන්ම, ශ්‍රී ලංකාව සහ දකුණු ආසියාතික රටවල් අතර සමීප සහයෝගීතාව ශක්තිමත් කිරීම ද සිය අමාත්‍යාංශයේ අරමුණ බව ලේකම්වරයා ප්‍රකාශ කළේය.

# පාර්ලිමේන්තු ඡායා ගැලරිය




## පාර්ලිමේන්තුවේ කටයුතු හා ක්‍රියාපටිපාටි පිළිබඳ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ සිසුන් දැනුවත් කෙරේ

















මෙවර සටහන - එච්. ඊ. ජනකාන්ත සිල්වා - අධ්‍යක්ෂ (ව්‍යවස්ථාදායක සේවා)/ අධ්‍යක්ෂ (සන්නිවේදන) (වැඩබලන)

## අප්‍රේල්

### 4 අඟහරුවාදා

- ශ්‍රී ලංකා මහබැංකු පනත් කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය පාර්ලිමේන්තුවට දැනුම් දීම.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40 ව්‍යවස්ථාව සහ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 7 හි විධිවිධාන ප්‍රකාරව 1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් පාර්ලිමේන්තුව විසින් ජනාධිපති ධුරය සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු තෝරා පත් කරගැනීම සඳහා 2022.07.20 දින පාර්ලිමේන්තුවේ දී පවත්වන ලද රහස් ඡන්දය විමසීමේදී භාවිතයට ගනු ලැබූ ඡන්ද පත්‍රිකා එකී පනතේ 18 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සහ 2023.03.24 දින පවත්වනු ලැබූ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ අනුමැතිය සහිතව පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් එම ඡන්ද පත්‍රිකා විනාශ කරනු ලැබූ බව පාර්ලිමේන්තුවට දැනුම්දීම.

- 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට පිළිගැන්වීම.

### 26 අඟහරුවාදා

- ශ්‍රී ලංකාව සඳහා ජාත්‍යන්තර අරමුදලේ (IMF) විස්තීරණ අරමුදල් පහසුකම යටතේ වූ සැකසුම ක්‍රියාත්මක කිරීම සඳහා වූ යෝජනා සම්මතය අනුමත කිරීමේ තෙදින විවාදය ආරම්භ කිරීම.

- කැළණිය බෞද්ධ කාන්තා පුන්‍යායතන සමිතිය සංස්ථාගත කිරීමේ පනත් කෙටුම්පත සහ ශ්‍රී ලංකා බදුකරණ කාර්යායතනය සංස්ථාගත කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත දෙවනවර කියවා ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට යොමු කිරීම.

### 27 බ්‍රහස්පතින්දා

- දූෂණ විරෝධී පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට පිළිගැන්වීම.

**28 සිකුරාදා**

- දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනි වර කියවා සංශෝධිත ආකාරයෙන් සම්මත කිරීම.



# පාර්ලිමේන්තු විත්ති

**පුවත් හසුන I 34 වැනි කාණ්ඩය I අප්‍රේල් 2023**

**ISSN 2806 – 5425**



**සන්නිවේදන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.**

දුරකථනය : +94 11 2777100 ෆැක්ස් : +94 11 2777227

www.parliament.lk

Parliament of Sri Lanka

@ParliamentLK

@slparliament

Parliament of Sri Lanka